## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
## ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ
## මුද්‍රණ යන්ත්‍ර සහායක, කාර්යාල කාර්ය සහායක (දෙපාර්තමේන්තුගත) සහ
## සංචාරක බංගලා මුරකරු තනතුරුවල
## පුරප්පාඩු විවෘත ධාරාව යටතේ පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් III ශ්‍රේණියේ මුද්‍රණ යන්ත්‍ර සහායක පුරප්පාඩු එක (01) ක්, කාර්යාල කාර්ය සහායක (දෙපාර්තමේන්තුගත) පුරප්පාඩු එක (01) ක් සහ සංචාරක බංගලා මුරකරු පුරප්පාඩු දෙක (02) ක් ඇති අතර එම පුරප්පාඩු විවෘත ධාරාව යටතේ පිරවීම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය :
ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය).

03. තනතුරට අදාල වැටුප් කේතය සහ වැටුප් පරිමාණය

3.1 වැටුප් කේතය : PL 01-2016

3.2 වැටුප් පරිමාණය : රු.24,250- 10x250-10x270-10x300-12x330-36,410 ක මාසික වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමි වේ.

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව අදාල තනතුරට පත් කිරීමේදී ගෙවන වැටුප තීරණය වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම්:

4.1 **අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදි දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

4.2 **වෘත්තීය සුදුසුකම් :**
අදාල නොවේ.

4.3 **පළපුරුද්ද :**
මුද්‍රණ යන්ත්‍ර සහායක සහ කාර්යාල කාර්ය සහායක : අදාල නොවේ.
සංචාරක බංගලා මුරකරු : අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

4.4 **කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.5 <u>වෙනත් සුදුසුකම් :</u>

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.6 <u>වයස</u> : අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ තනතුරුවලට පත් කරනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය ඇමුණුම 1 මගින් දැක්වේ.

06. අයදුම්පත් මෙම දැන්වීම සමඟ ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව සකස් කර නිවැරදි ලෙස සම්පූර්ණ කර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර පැහැදිළිව සඳහන් කර 2019.05.30 දිනට හෝ එදිනට පෙර **"අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අංක 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල"** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

07. අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර එදිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන අවසන් තීරණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

අයි.ආර්.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඇමුණුම 1

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ

මුද්‍රණ යන්ත්‍ර සහායක, කාර්යාල කාර්ය සහායක සහ සංචාරක බංගලා මුරකරු තනතුරුවල පුරප්පාඩු විවෘත ධාරාව යටතේ පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය- ලකුණු පරිපාටිය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| **1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>අ.පො.ස. (උ/පෙළ) සමත් වීම<br>විෂයයන් තුන (03)ම සමත් වීම සඳහා — ලකුණු 20ක්<br>විෂයයන් දෙක (02)ක් සමත් වීම සඳහා — ලකුණු 10ක්<br>එක් විෂයයක් (01) සමත් වීම සඳහා — ලකුණු 05ක්<br>මූලික සුදුසුකම්වලට අමතරව අ.පො.ස. (සා/පෙළ) ගණිතය, භාෂාව, දෙවැනි රාජ්‍ය භාෂාව, ඉංග්‍රිසි සහ වෙනත් භාෂා සමත්වීම එක් සාමාර්ථයක් සඳහා ලකුණු 4 බැගින් — ලකුණු 20ක් | 40 |
| **2. පළපුරුද්ද (සහතික මඟින් සනාථ කල යුතුය)**<br>පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 5 බැගින් උපරිම වසර 06 ක් සඳහා (5x6=30)<br>පිළිගත් ආයතනයක වෙනත් ක්ෂේත්‍රයන්ට අදාලව පළපුරුද්ද සඳහා උපරිම වසර 06 ක් සඳහා (2x6=12) | 30 |
| **3. වෘත්තීය සුදුසුකම්**<br>පිළිගත් ආයතනයක තාක්ෂණ / කාර්මික පාඨමාලා හදාරා සහතික ලබා තිබීම සඳහා<br>වසරකට වැඩි පුහුණු පාඨමාලාවක් සඳහා — ලකුණු( 5x2=10)<br>මාස 06කට නොඅඩු වසරකට නොවැඩි පුහුණු පාඨමාලාවක් සඳහා — ලකුණු (3x3=09)<br>මාස හයකට අඩු පුහුණු පාඨමාලාවක් සඳහා — ලකුණු (2x3=06)<br>මුද්‍රණ යන්ත්‍ර සහායක සඳහා අදාල ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා හදාරා සහතික ලබා තිබීම සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | 25 |
| **4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය** | 05 |
| **5. එකතුව** | 100 |

අයි.ආර්.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව